ඇමුණුම 01

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2
සේවා ගණය (ඖෂධ සංයෝජක තනතුර) සඳහා වන
බඳවා ගැනීමේ පරිපාටිය.

01.සම්බන්ධ වන ආයතන

1.1. දෙපාර්තමේන්තුව : බන්ධනාගාර යොමු අංකය : බී8/21/බ.පරි/ඖ දිනය : 2014.12.15

1.2. අමාත්‍යංශය : බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යංශය
යොමු අංකය : MPRRH/06/01/බන්ධ/ඖෂධ සං(විශේෂ) දිනය :2016.05.31

1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම : යොමු අංකය : DMS/B2/48/01/Vol.II දිනය: 2013.09.24

1.4. ආයතන අධ්‍යක්ෂක ජනරාල්ගේ නිර්දේශය :
යොමු අංකය : EST-2/RECRU/05/4822 දිනය: 2014.11.13
යොමු අංකය : EST-2/RECRU/05/4822 දිනය: 2017.10.12

1.5. ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : NPC/6/18/096/SR-II දිනය: 2014.09.26
යොමු අංකය : NPC/6/18/096/SR-II දිනය: 2017.10.04

1.6. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :
යොමු අංකය : PSC/EST/02-01-18/01/2015 දිනය:2016.07.13
සංශෝධිත දිනය යොමු අංකය : PSC/EST/02-01-18/01/2015 දිනය:2017.09.28

02. පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය : කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2

3.2. ශ්‍රේණි : III, II, I

3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :
ආයතනයන් හි විධායක කළමනාකරණ හා පරිපාලන මට්ටම්වල නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා /හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් විශේෂිත තාක්ෂණික නිපුණතාවයන් එනම්:, තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා හය (06) මට්ටම යටතට ගැනෙන්නා වූ ද පාඨමාලා කාල සීමාව මාස 13 සහ 24 අතර වූ අදාළ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා හිමිකරගත යුතු නිපුණතා අවශ්‍ය වන කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම සේවා ගණයේ කාර්යයන් අතුරින් පත්කිරීම් බලධාරියා විසින් සුවිශේෂී කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

3.4 කාර්යයන් පැවරීම :
ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතු වේ.



CamScanner

## 05. වැටුප්

5.1. වැටුප් කේත අංකය : MT- 2 – 2016

5.2. වැටුප් පරිමාණය : රු:30,140 – 10 x 350 – 11 x 370-10 x 560 – 10 x660 - 49,910/-

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| III | පියවර 01 | 30,140/- |
| II | පියවර 12 | 34,010/- |
| I | පියවර 23 | 38,270/- |

5.4. පුහුණු කිරීමේ ශ්‍රේණියේ දීමනාව :

| | 2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා | 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා | 2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා | 2020.01.01 දින සිට ඉදිරියට |
|---|---|---|---|---|
| මාසික දීමනාව (රු.) | 17,798.00 | 20,462.00 | 23,126.00 | 25,790.00 |
| ගැලපුම් දීමනාව (රු.) | 7,293.00 | 4,629.00 | 1,965.00 | |

## 06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ඖෂධ සංයෝජක | III, II, I | 82 | • වෛද්‍ය නිලධාරී විසින් නිර්දේශිත ඖෂධ වට්ටෝරුවල ඇතුළත් සියලුම ඖෂධ වර්ග රෝගීන් සඳහා නිකුත් කිරීම හා රෝගීන්ට ඖෂධ පිළිබඳ නිසි උපදෙස් ලබාදීම.<br>• නිවැරදි ප්‍රමිතීන්ට අනුකූලව සාන්ද්‍රණගත විෂබීජ නාශක දියර ආදිය සකස් කර රෝහල් වාට්ටු සැරහුම් කාමර, ශල්‍ය කාමර ආදී අනෙකුත් අංශ වෙත නිකුත් කිරීම.<br>• ඖෂධ, ශල්‍ය ද්‍රව්‍ය, සැරහුම් ද්‍රව්‍ය, උපකරණ, වාට්ටු සැරහුම් කාමර, ශල්‍ය කාමර හා අනෙකුත් අංශ වෙත නිකුත් කිරීම.<br>• ඖෂධ, ශල්‍ය හා සැරහුම් ද්‍රව්‍ය ලබා ගැනීම හා නිකුත් කිරීමේ ලේඛන දෛනිකව පවත්වාගෙන යාම හා එම ද්‍රව්‍යන්හි තොග පිළිබඳව සියලුම වගකීම් සෘජු ලෙස දැරීම.<br>• ආයතනයේ වාර්ෂික ඖෂධ, ශල්‍ය හා සැරහුම් ඇස්තමේන්තු පිළියෙළ කිරීම සඳහා ආයතන ප්‍රධානියාට සහය වීම.<br>• ඖෂධ ශාලාවේ සාමාන්‍ය හා ශල්‍ය වට්ටෝරුගත ලේඛන නිසිලෙස පවත්වාගෙන යාම, තොග භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලදී අදාළ මණ්ඩල වෙත ඒ සඳහා සහයෝගය ලබාදීම.<br>• රෝගීන්ට ඖෂධ භාවිතය, ඖෂධ වල අතුරු ප්‍රතිඵල ආදී කරුණු පිළිබඳව දැනුම ලබාදීම.<br>• ඉතා සීමිත තනතුරු සංඛ්‍යාවක් අනුමත බැවින් I, II, III සියලුම නිලධාරීන් ඔවුන් වෙත පවරනු ලබන සියලුම කාර්යයන් ඉටුකළ යුතුය. |



CamScanner

6.2. ඒකාබද්ධ නිළධර සංඛ්‍යාව : 82

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II හා I යන ශ්‍රේණිත් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

### 7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | 100% |
| කුසලතා | - |

සටහන:

විවෘත හා සීමිත ධාරාව යටතේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා එකම අවස්ථාවේදී අයදුම්පත් කැඳවනු ලැබේ. සියලුම අයදුම්කරුවන් සඳහා එක් තරඟ විභාගයක් පමණක් පවත්වනු ලැබේ. ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන, සීමිත ධාරාව යටතේ ඉල්ලුම් කළ නිලධාරීන් කුසලතා අනුපිළිවෙල අනුව පළමුව බඳවාගනු ලැබේ. සීමිත ධාරාව යටතේ බඳවා ගැනීමෙන් පසු පවතින පුරප්පාඩු ප්‍රමාණය සඳහා විවෘත ධාරාවෙන් සුදුසුකම් ලබන පුද්ගලයින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවාගනු ලැබේ.

### 7.2 විවෘත බඳවා ගැනීම

7.2.1. බඳවා ගන්නා ශ්‍රේණිය : පුහුණු ශ්‍රේණිය

7.2.2. සුදුසුකම්:

7.2.2.1. අධ්‍යාපන සුදුසුකම් : I. රසායන විද්‍යාව ඇතුළුව විද්‍යා විෂය ධාරාවේ විෂයන් තුන (03) කින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත් වීම.

සහ

II. සිංහල / දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව එක වරකදී විෂයයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

7.2.2.2. වෘත්තීය සුදුසුකම් : තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (06) මට්ටමට අදාළ වන්නා වූ ඖෂධ සංයෝජක පුහුණු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.

සටහන : සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොමැති අවස්ථාවලදී 7.2.2.1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිත අයදුම්කරුවන් පුහුණු ශ්‍රේණියට බඳවාගෙන, සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් පවත්වනු ලබන පූර්ණ කාලීන අවුරුදු 01 ක න්‍යායාත්මක හා සිමාවාසික ඖෂධ සංයෝජක පුහුණු පාඨමාලාවට ඇතුළත් කරනු ලබන අතර එම පුහුණුව අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණය සමත් වීමෙන් අනතුරුව ඖෂධ සංයෝජක III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

7.2.2.3. පළපුරුද්ද : අදාළ නොවේ.

7.2.2.4. කායික සුදුසුකම : I. පිරිමි - අවම උස අඩි 5 අඟල් 4 ට නොඅඩු විය යුතුය.

කාන්තා - අවම උස අඩි 5 අඟල් 2 ට නොඅඩු විය යුතුය.

II. පිරිමි අයදුම්කරුවන් සඳහා පපුව හුස්ම නාල්ලා අඟල් 32ක් විය යුතුයි. මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතු අතර, යහපත් චරිතයකින් ද යුක්ත අයවලුන් විය යුතුයි. චරිත දූෂණයට අදාළ වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීම ඉහත තනතුරට පත්වීම සඳහා සම්පූර්ණ නුසුදුසුකමක් වන්නේය

7.2.2.5. වෙනත්

1. ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුයි.
2. මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතු අතර, යහපත් චරිතයකින් ද යුක්ත අයවලුන් විය යුතුය. එය පොලිස් නිශ්කාෂණ වාර්තාවක් මඟින් සනාථ කර ගැනීමට කටයුතු කෙරේ.
3. තනතුරට බඳවා ගැනීම සඳහා 7.2.2.1 හා 7.2.2.5 දක්වා සුදුසුකම සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවන නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතුය.
4. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.3. වයස

7.2.3.1. : අවම සීමාව : අවුරුදු 18
7.2.3.2. : උපරිම සීමාව : අවුරුදු 35

7.2.4. බඳවා ගැනීමේ ක්‍රමය:

7.2.4.1. ලිඛිත විභාගය ( විෂය නිර්දේශය සඳහා ඇමුණුම 01 බලන්න )

| | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | 100% | 40% |
| 02 | විෂයානුබද්ධ සාමාන්‍ය දැනීම | 100% | 40% |

7.2.4.1.1. පවත්වන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්.

7.2.4.2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : (ලකුණු ලබා දෙනු නොලැබේ)

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : කායික සුදුසුකම් හා අනෙකුත් අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇත්දැයි පරීක්ෂා කිරීම සඳහා

7.2.4.3.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධාරියා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

7.2.4.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ : අදාළ නොවේ.

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මඟින්



CamScanner

7.3. සීමිත බඳවා ගැනීම :

7. 3. 1. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7. 3. 2. සුදුසුකම්:

7. 3. 2. 1. අධ්‍යාපන සුදුසුකම් : I. සිංහල/ දෙමළ /ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබිම.

සටහන : තෝරාගනු ලබන අයදුම්කරුවන් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන පූර්ණ කාලීන අවුරුදු 01 ක න්‍යායාත්මක හා සීමාවාසික ඖෂධ සංයෝජක පුහුණු පාඨමාලාවට ඇතුළත් කරනු ලබන අතර එම පුහුණුව අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණය සමත් වීමෙන් අනතුරුව ඖෂධ සංයෝජක III ශ්‍රේණියට පත් කරනු ලැබේ. පුහුණු කාලය තුළ වර්තමාන තනතුරට අදාළ වැටුප ගෙවනු ලැබේ.

7. 3. 2. 2. වෘත්තිය සුදුසුකම් : අදාළ නොවේ.

7. 3. 2 . 3. පලපුරුද්ද : නියාමක තනතුරේ වසර පහ (05) ක හෝ දෙපාර්තමේන්තුගත ප්‍රාථමික තනතුරක වසර දහය (10)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් තිබීම.

7. 3. 2. 4. කායික සුදුසුකම් : I. පිරිමි - අවම උස අඩි 5 අඟල් 4 ට නොඅඩු විය යුතුය. පපුව හුස්ම නාල්ලා අඟල් 32 ක් විය යුතුය.

II. කාන්තා - අවම උස අඩි 5 අඟල් 2 ට නොඅඩු විය යුතුය.

7. 3. 2. 5. වෙනත් : තනතුරට බඳවා ගැනීම සඳහා 7.3.2.1 සිට 7.3.2.5 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවන නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතුය.

7. 3. 3. වයස : අදාළ නොවේ.

7. 3. 4. බඳවා ගැනීමේ ක්‍රමය:

7. 3. 4. 1. ලිඛිත විභාගය (විෂය නිර්දේශය සඳහා ඇමුණුම 01 බලන්න )

| | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | 100% | 40% |
| 02 | විෂයානුබද්ධ සාමාන්‍ය දැනීම | 100% | 40% |

7. 3. 4 .1.1. පවත්වන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් බලය පවරන ආයතනයක් මගින්

7. 3. 4, 2. වෘත්තිය පරීක්ෂණය : අදාළ නොවේ.

7. 3. 4. 3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : (ලකුණු ලබාදෙනු නොලැබේ)
ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : කායික සුදුසුකම් හා අනෙකුත් අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇත්දැයි පරීක්ෂා කිරීම සඳහා



CamScanner

7.3.4.3.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධාරියා :

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

7.3.4.4. ශක්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ : අදාළ නොවේ.

7.3.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අභ්‍යන්තර නිවේදනයක් මගින් සියලුම බන්ධනාගාර ආයතන වලින් අයදුම්පත් කැඳවා ලිඛිත විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.5 පුහුණු කිරීමේ ශ්‍රේණිය අවසානයේදී III ශ්‍රේණියට බඳවා ගන්නා ආකාරය :

I. විවෘත ධාරාව යටතේ පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කරගනු ලබන අයදුම්කරුවන් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පුහුණු කරනු ලබන අතර බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පුහුණු කාල සීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන පරීක්ෂණය සමත් වීමෙන් පසුව III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ .

II. පුහුණුව අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණය සමත් වීමට අපොහොසත් වන අය වෙතොත් ඔවුනට මාස හය (06) කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන විවෘත ධාරාව යටතේ බඳවාගත් අයගේ සේවය අවසන් කරනු ලබයි.

III. සීමිත ධාරාව යටතේ පුහුණුවට ඇතුළත් කරගනු ලබන අයදුම්කරුවන් ද සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පුහුණු කරනු ලබන අතර බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පුහුණු කාල සීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන පරීක්ෂණය සමත් වීමෙන් පසුව III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. පුහුණුව අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණය සමත් වීමට අපොහොසත් වන අය වෙතොත් ඔවුනට මාස හය (06) කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන සීමිත ධාරාව යටතේ බඳවාගත් අය ඔවුන්ගේ පූර්ව තනතුරුවලට මුදා හැරේ.

08. කාර්යක්ෂමතා කඩඉම

8.1.

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| I කාර්යක්ෂමතා කඩඉම. | III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත, ප්‍රායෝගික, වාචික පරීක්ෂණය |
| II වන කාර්යක්ෂමතා කඩඉම. | II ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය |
| III වන කාර්යක්ෂමතා කඩඉම. | I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය |

(විෂය නිර්දේශය සඳහා ඇමුණුම් 02, 03, 04 බලන්න.)

8.2. කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්



CamScanner

8.3. කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

| | |
|---|---|
| I කාර්යක්ෂමතා කඩඉම | : බඳවාගැනීමේ අධිකාරිය/ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් |
| II වන කාර්යක්ෂමතා කඩඉම | : බඳවාගැනීමේ අධිකාරිය/ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් |
| III වන කාර්යක්ෂමතා කඩඉම | : බඳවාගැනීමේ අධිකාරිය/ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් |

09. භාෂා ප්‍රවීණතාව :

9.1.

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම.

10.1. III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.

10.1.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක හා සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය(10) ක් උපයා ගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2. උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම, සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.2. II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය(10) ක් උපයා ගෙන තිබීම.

II. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

III. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

11. තනතුරට පත් කිරීම : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටිවල දැක්වෙන පොදු අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි:

සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

**<u>14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :</u>**

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 මගින් ලබා දී ඇති MT-02-2016 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියලුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත් ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට වැටුප් කම්ටු නිර්දේශ අනුව අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත්කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනසව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදුකළ යුතුය.

(i) MT-02-III ශ්‍රේණිය

(අ) III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ වුවද II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධරයන් MT-02-III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.



CamScanner

(ii) MT-02-II ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10ක් හෝ ඊට වැඩි එනෙත් අවුරුදු 20කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අවම වශයෙන් අවුරුදු දහය (10)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නව බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීම් පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සම්පූර්ණ කර ඇති නිලධරයන්.

(ආ) MT-02-2016 වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර දහය (10) ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන්.

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර දහය (10) ක් සම්පූර්ණ වුවද නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධරයන්.

MT-02-II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ

(iii) MT-02-I ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු විස්ස (20) ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක විස්ස (20) ක් හා නව බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධරයන්.

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර දහය (10) ක් හෝ ඊට වැඩි සේවා කාලයක් ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධරයන්

(ඇ) MT-02-2016 වැටුප් පරිමාණයේ I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක සිටින නිලධරයන්

MT-02-I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටිවල දැක්වෙන අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ : අත්සන ..............................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : කේ.එස්. අමරවික්‍රම

තනතුර : පරිපාලන නිලධාරී / බන්ධනාගාර කොමසාරිස් ජ...

දිනය : 2017.10. 23

පරීක්ෂා කළේ : අත්සන : ..............................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : එම්. වෙනුර ගුණවර්ධන / අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

තනතුර : බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 09.

දිනය : 2017.10. 24

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : එච්.එම්.එන්.බී. ධනසිංහ

තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

නිල මුද්‍රාව: බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

දිනය: 2017.10.

යොමු අංකය : MPRRH/6/2/PR/ බ.සේ.ත.

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හි ඔසු ළඟ සංයෝජක තනතුර

තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..............................

නම : ..............................

ලේකම

..............................:අමාත්‍යාංශය

නිල මුද්‍රාව: ..............................

එස්. භාස්කරන්
[illegible]
බන්ධනාගාර [illegible]
පදිංචි [illegible]
අංක. 358 බී, කෝට්ටේ පාර, කොළඹ 08.

දිනය : 2017.10.15

6

---

යොමු අංකය : PSC/EST/02-01-18/01/2015

බන්ධනාගාර දෙපාර්තමේන්තුව හි ඔසු ළඟ සංයෝජක තනතුර

සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2016.07.13 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්

අනුමත කරන ලදී.

අත්සන : ..............................

නම : ඒ. කුලතුංග

ලේකම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නිල මුද්‍රාව: ..............................

දිනය : ~~2017.10.~~
2017.11.27

01.විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ - බණ්ඩ 2 සේවා ගණයේ නිලධාරීන් බාහිර හා අභ්‍යන්තර (සීමිත) බඳවා ගැනීම සඳහා පැවැත්වෙන විභාගය

02. විභාගය පිළිබඳ විස්තර:

| | ප්‍රශ්න පත්‍රය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01. | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100% | 40% |
| 02. | විෂයානුබද්ධ සාමාන්‍ය දැනීම | පැය 01 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු අනුව වසරකට වරක්.

05.විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | සිතීමේ තර්කානුකූලතාවයන්, සිතීමේ විශ්ලේෂණ තත්වයන් තීරණය කිරීමේ ශක්තිය මත හා ගණිතමය හැකියාව මැන බැලීම සඳහා බහුවරණ 50 කින් යුක්ත ප්‍රශ්න පත්‍රයකි. |
| 02 | විෂයානුබද්ධ සාමාන්‍ය දැනීම | විෂය ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික දැනුම පරීක්ෂා කිරීම, ජාතිකව හා අන්තර්ජාතිකව වැදගත් වන නූතන කරුණු, විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් ඇති දැනුම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍රයකි. |

සකස් කළේ :
අත්සන : ජී.එස්. අමරවික්‍රම
නම : පරිපාලන නිලධාරී I
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය : 2017.10. 23

පරීක්ෂා කළේ :
අත්සන : එම්. චෙනුර ගුණවර්ධන
නම : අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
තනතුර : බන්ධනාගාර මූලස්ථානය කොළඹ 09.
දිනය : 2017.10.

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : එච්.එම්.එන්.සී. ධනසිංහ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් බන්ධනාගාර මූලස්ථානය කොළඹ 09.
දිනය : 2017.10.
නිල මුද්‍රාව : ..............................



CamScanner

01. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය I

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ලිඛිත | පැය 02 | 200% | 80% |
| ප්‍රායෝගික | පැය 01 | 100% | 40% |
| වාචික | පැය 1/2 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන ආයතනය : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ලිඛිත | බහුවරණ හා රචනා<br>(එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 30% ක් ලබාගත යුතු අතර, ප්‍රශ්න පත්‍ර දෙකෙහිම එකතුව 80% ක් විය යුතුය. )<br>• වට්ටෝරු අනුව බෙහෙත් සෑදීම<br>• මාත්‍රා වර්ග<br>• ගබඩා කිරීම<br>• කිරුම් මිනුම් |
| ප්‍රායෝගික | • සී එම් එෆ් නිර්දේශිත මිශ්‍රණවල සංයුතිය බෙහෙත් සඳහා පාවිච්චි කරන ආලේපන, අක්ෂි, කන, නාසය, උගුර සඳහා යෙදෙන නිෂ්පාදන වල සංයුතිය |
| වාචික | • බෙහෙත් ශාලා නඩත්තු කිරීම |

ලිඛිත, ප්‍රායෝගික සහ වාචික කොටස් එක වරකදී හෝ වෙන වෙනම වාර වලදී කොටස් වශයෙන් සමත් වී සම්පූර්ණ විභාගයෙන් සමත් විය හැක. එමෙන්ම පළමු වතාවට පෙනී සිටින අයදුම්කරුවන්ට සියලුම විෂයයන් සඳහා ඉල්ලුම් කළ හැක.

සකස් කළේ :
අත්සන :
නම : සී.එස්. අමරවික්‍රම
තනතුර : පරිපාලන නිලධාරී I
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය : 2017.10.13

පරීක්ෂා කළේ :
අත්සන
නම : එම්. චතුර ගුණවර්ධන
තනතුර : අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
දිනය : 2017.10.

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : එච්.එම්.එන්.සී. ධනසිංහ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
දිනය : 2017.10. බන්ධනාගාර මූලස්ථානය
නිල මුද්‍රාව : කොළඹ 09.



CamScanner

ඇමුණුම 03.

01. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 02 සේවා ගණය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය II

02. විභාගය පිළිබඳ විස්තර :

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 01. | ආයතන සංග්‍රහය | පැය 02 | 100% | 40% |
| 02. | මුදල් රෙගුලාසි | පැය 01 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධාරියා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලැබූ ආයතනයක් මගින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|---|
| 01 | ආයතන සංග්‍රහය | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සහ ආයතන සංග්‍රහයේ II, IV, V, VII, IX, XLVIII පරිච්ඡේදයන් |
| 02 | මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි I, II, III, IV, VI, VII පරිච්ඡේදයන් |

සකස් කළේ :
අත්සන : ...............සී.එස්. අමරවික්‍රම
නම : ...............පරිපාලන නිලධාරී I
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ශාඛා කාර්යාලය
දිනය : 2017.10. 23

පරීක්ෂා කළේ : එම්. වෙනුර ගුණවර්ධන
අත්සන අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
නම : ...............බන්ධනාගාර මූලස්ථානය
තනතුර : ...............කොළඹ 09.
දිනය : 2017.10. 24

අත්සන : ...............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ...............එච්.එම්.එන්.සී. ධනසිංහ
තනතුර : ...............බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
දිනය : 2017.10. බන්ධනාගාර මූලස්ථානය
නිල මුද්‍රාව : ...............කොළඹ 09.

01. විභාගයේ නම : [illegible] සහකාර නායක්මණ් වර්ග - 02 සේවා [illegible] විභාගය III.

02. විභාගය පවත්වන ක්‍රමය

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් වීම සඳහා අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග | පැය 02 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන ආකාරය : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග | දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග සංග්‍රහයේ 01 සිට 985 දක්වා |

සකස් කළේ :
අත්සන : ...................... සී.එස්. අමරවික්‍රම
නම : ...................... පරිපාලන නිලධාරී
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවෙන්
දිනය : 2017.10. 13

පරීක්ෂා කළේ : එම්. චෙතුර ගුණවර්ධන
අත්සන : අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
නම : ...................... බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
තනතුර : ......................
දිනය : 2017.10.

අත්සන : ......................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ...................... එච්.එම්.එන්.සී. ධනසිංහ
තනතුර : ...................... බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
දිනය : 2017.10. බන්ධනාගාර මූලස්ථානය
නිල මුද්‍රාව : ...................... කොළඹ 09.



CamScanner